**ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ, විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 12 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරිම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 963.00 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 936.62 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 26.38 ක් හෙවත් සියයට 2.74 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 886.00 | 859.74 | 26.26 | 2.96 |
| මුලධන | 77.00 | 76.88 | 0.12 | 0.16 |
| **එකතුව** | **963.00** | **936.62** | **26.38** | **2.74** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 12 ක් හා දෙපාර්තමේන්තුවක් විසින් එකතුව රු.මිලියන 2,339.76 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර, එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 2,251.44 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 88.32 ක් හෙවත් සියයට 3.77 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 50.00 | 49.99 | 40.00 | 49.15 | 350.00 | 152.26 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ තැන්පත් ගිණුම් 6 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 214.67 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0089/000 | 9.30 |
| 6000/0000/00/0002/0119/000 | 1.90 |
| 6000/0000/00/0014/0013/000 | 13.04 |
| 6000/0000/00/0016/0067/000 | 154.03 |
| 6000/0000/00/0017/0020/000 | 1.52 |
| 6000/0000/00/0020/0011/000 | 34.89 |
| **එකතුව** | **214.67** |

**2.4 විගණන නිරීක්ෂණය**

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් පවත්වා නොතිබුණි. |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) | ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය හා බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 451 හා 454(1) | උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. |
| (iv) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් පවත්වා නොතිබුණි. |
| (v) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 ක් විසින් පවත්වා නොතිබුණි. |
| (vi) | ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් පවත්වා නොතිබුණි. |

**3.2 වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

-----------------------------------------------------------------------------------------------

**3.2.1 බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික අමාත්‍යාංශයේ ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම.**

-----------------------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නැවත පදිංචි කරන ජනතාව සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන**

---------------------------------------------------------------------------

මෙම ව්‍යාපෘතිය යටතේ ස්වයං රැකියාලාභීන් වෙත ගවයින් හා එළුවන් ලබාදීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) ස්වයං රැකියාලාභීන් වෙත ගවයන් බෙදාදීම**

-----------------------------------------------

නාවිදන්වෙලි හා ආලයඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මෙම වැඩසටහන යටතේ ස්වයං රැකියාලාභීන් වෙත ලබා දීම සඳහා රු.මිලියන 7.85 ක් වැය කර ගවයින් 79 ක් මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- නාවිදන්වෙලි හා ආලයඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රසම්පාදන කමිටු තීරණ අනුව සහිවාල් මිශ්‍ර (Sahival Mix) වර්ගයේ ගවයින් 79 දෙනෙකු මිලදී ගැනීම අනුමත කර තිබුණි. නමුත් එම තීරණයට පටහැනිව දේශීය හා ජර්සි වර්ගවල ගවයින් 49 දෙනෙකු මිලදී ගෙන ස්වයං රැකියාලාභීන් වෙත බෙදා දී තිබුණි. මේ නිසා වැඩසටහන මඟින් අපේක්ෂිත ගවයින් ස්වයං රැකියාලාභීන්ට ලබා දීමට නොහැකි වී තිබුණි.

- 2016 ජනවාරි 01 දිනැති අංක 03/2016 දරන ජාතික පශු සම්පත් මණ්ඩලයේ චක්‍රලේඛය මගින් ලබා දී තිබුණු උපදෙස් අනුව සහිවාල් මිශ්‍ර වර්ගයේ ගවයෙකුගේ බර කිලෝ ග්‍රෑම් 1 කට රු.250 බැගින් ගෙවීම් කළ යුතුව තිබුණි. ඉහත ගවයින් 79 දෙනාගේ සාමාන්‍ය මුළු බර කිලෝ ග්‍රෑම් 15,958 ක් සඳහා රු.3,989,500 ක් ගෙවිය යුතුව තිබුණි. නමුත් ගවයින් 79 ක් වෙනුවෙන් රු.7,850,000 ක් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගෙවා තිබුණි. ඒ අනුව රු.3,860,500 ක් වැඩිපුර ගෙවා තිබුණි.

- තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉහත ව්‍යාපෘතිය යටතේ මිලදී ගත් ගවයින් 04 දෙනාගේ මුළු බර කිලෝ ග්‍රෑම් 808 කට ඉහත සඳහන් ජාතික පශු සම්පත් මණ්ඩලයේ චක්‍ර ලේඛය ප්‍රකාරව රු.202,000 ක් ගෙවිය යුතිව තිබුණත්, ඒ සඳහා රු.396,200 ක් ගෙවා තිබුණි. ඒ අනුව රු.194,200 ක් වැඩිපුර ගෙවා තිබුණි.

**(ii) ස්වයං රැකියාලැභීන් වෙත එළුවන් බෙදාදීම**

**--------------------------------------------**

නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ රු.600,000 ක් වැය කර එළුවන් 35 දෙනෙකු මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2016 ජනවාරි 01 දිනැති අංක 03/2016 දරන ජාතික පශු සම්පත් මණ්ඩලයේ චක්‍රලේඛය ප්‍රකාරව එළුවකුගේ බර කිලෝ ග්‍රෑම් 1 කට රු.800 ක් ගෙවිය යුතුව තිබුණි. මිලදී ගත් එළුවන් අතරින් 2017 පෙබරවාරි 15 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී එළුවන් 08 දෙනෙකුගේ මුළු බර කිලෝ ග්‍රෑම් 176 ක් වෙනුවෙන් රු.140,800 ක් ගෙවිය යුතුව තිබුණත්, ඒ සඳහා 2016 දෙසැම්බර් 27 දින කිලෝ ග්‍රෑම් 248 ක් වෙනුවෙන් රු.198,400 ක් ගෙවා තිබුණි. ඒ අනුව රු.57,600 ක් වැඩි පුර ගෙවා තිබුණි.

- එමෙන්ම මිලදී ගන්නා ලද මුළු එළුවන් ගණන 35 ක් වුවත්, ප්‍රතිලාභීන් වෙත එළුවන් 30 ක් පමණක් බෙදා දී තිබුණි. ඒ අනුව රු.85,715 ක් වටිනා එළුවන් 5 දෙනෙකු වැඩසටහනේ අරමුණුවලට පටහැනිව අදාළ ප්‍රතිලාභීන් වෙත බෙදා නොදී අවිධිමත් ලෙස බෙදා දී තිබුණි.

**(ආ) අවතැන් වූ ජනතාව සඳහා නිවාස ඉදිකරදීමේ ව්‍යාපෘතිය**

**-------------------------------------------------------**

මෙම ව්‍යාපෘතිය යටතේ අවතැන්වූ ජනතාව සඳහා "නිවාස ඉදිකර දීම" සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i). ආලයඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 අප්‍රේල් 25 දිනැති අංක එම්ආර්/4/1 දරන බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ උපදෙස් පරිදි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ඉහළ ලකුණු ලබාගත් ප්‍රතිලාභීන් 13 දෙනෙකු නිශ්චිත හේතුවක් නොමැතිව ඉවත් කර තිබුණි. ලකුණු 55 ක සිට 75 ක් දක්වා පරාසයක ප්‍රමාණයක අඩු ලකුණු ලබා ගත් ප්‍රතිලාභීන් 08 දෙනෙකු තෝරාගෙන තිබුණි. මේ නිසා නිවාස ලැබීමට සුදුසුකම් සහිත ප්‍රතිලාභීන්ට ව්‍යාපෘතිය යටතේ වූ ප්‍රතිලාභ ලබා ගැනීමට තිබුණු අවස්ථාව අහිමි වී තිබුණි.

(ii). ආලයඩිවෙම්බු හා නාවිදන්වේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව අවිධිමත් ලෙස තෝරාගත් ප්‍රතිලාභීන් 21 දෙනෙකුට රු.මිලියන 5.79 ක් ප්‍රතිලාභ ගෙවා තිබුණි.

(iii). තෝරාගන්නා ලද ප්‍රතිලාභීන්ට නිවාස ඉදිකිරීමට අපේක්ෂිත ඉඩමේ අයිතිය පැවතිය යුතු වුවත්, නාවිදන්වේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඩම්වල අයිතිය නොතිබුණු ප්‍රතිලාභීන් 08 දෙනෙකු තෝරාගෙන නිවාස ඉදිකර දී තිබුණි.

(iv). 2016 අප්‍රේල් 25 දිනැති අංක එම්ආර්/4/1 දරන බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව රු.190,000 ක් වූ පළමු වාරිකය වැඩ ආරම්භ කිරීමට පෙර ගෙවිය යුතුව තිබුණි. නමුත් සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන් 07 දෙනෙකු වෙත පළමු වාරිකය අදාළ වැඩ නිම කර මාසයක ප්‍රමාදයකින් පසුව ගෙවා තිබුණු බැවින්, අදාළ ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වී තිබුණි.

(v). ඇස්තමේන්තුව අනුව පිටත බිත්තිවල ඝනකම අඟල් 06 ක් තිබිය යුතු වුවත්, නාවින්දවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ඉදිකරන ලද නිවාස 04 ක පිටත බිත්තිවල ඝනකම අඟල් 04 ක් පමණක් පැවති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එබැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නිවැරදි අධීක්ෂණයක් සිදුනොකිරීම නිසා ප්‍රතිලාභීන්ට අමතර වියදමක් කිරීමට සිදුවන බව නිරීක්ෂණය විය.

**(ඈ) අවතැන් වූ ජනතාව සඳහා සනීපාරක්ෂක ඒකක ඉදිකරදීමේ ව්‍යාපෘතිය**

**---------------------------------------------------------------------**

තෝරාගනු ලබන ප්‍රතිලාභීන් සඳහා දිස්ත්‍රික් ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවත්, දමන, අඩ්ඩාලච්චේන හා ආලයඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2016 අප්‍රේල් 25 දිනැති අංක එම්ආර්/4/1 දරන බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 3.1 ඡේදයට පටහැනිව අවිධිමත් ලෙස තෝරාගත් ප්‍රතිලාභීන් 142 දෙදෙනෙකු වෙත දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතියෙන් තොරව රු.මිලියන 6.92 ක් වැය කර තිබුණි

**(ඈ) අවතැන් වූ ජනතාව සඳහා පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතිය**

**---------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ඉදිකල ජල ළිං 30 කින් ජල ළිං 10 ක් පිළිබඳව සිදු කළ භෞතික පරීක්ෂාවේදී එක් ප්‍රතිලාභියෙකු විසින් ගැඹුර අඩි 18 ක් දක්වා ඔහුගේ ශ්‍රමය භාවිතා කර ළිද හාරා තිබුණත්, ඇස්තමේන්තුවේ සඳහන් ළිඳ හැරීම සඳහා වූ රු.22,625 ක මුදල කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. තවත් ප්‍රතිලාභියෙකු ළිඳ හැරීම වෙනුවෙන් රු.18,000 ක් පුද්ගලිකව කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු බැවින්, එම ජල ළිං 02 වෙනුවෙන් රු.40,625 ක් කොන්ත්‍රාත්කරුවන්ට වැඩිපුර ගෙවා තිබුණි.

(ii). ඉහත ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 292 දෙනෙකු සඳහා පානීය ජල පහසුකම් ලබාදීමට රු.මිලියන 3.82 ක් උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 ඔක්තෝබර් 26 දින ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ගෙවා තිබුණි. 2017 ජූලි 06 දින වන විටත් ප්‍රතිලාභීන් 225 දෙනෙකු සඳහා පමණක් ජල සැපයුම් ලබාදී තිබුණි. එමෙන්ම

ප්‍රතිලාභීන් 26 දෙනෙකු ජල පහසුකම් ලබාගැනීම සඳහා පුද්ගලිකව මුදල් ගෙවා තිබුණත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ද එම ප්‍රතිලාභීන් වෙනුවෙන් රු.338,922 ක් ගෙවා තිබුණි. එම වැඩිපුර ගෙවා තිබුණු මුදල 2017 ජුලි 12 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ) අවතැන් වූ ජනතාව සඳහා ජීවනෝපාය සහය වැඩසටහන**

ඉහත වැඩසටහන යටතේ අවතැන් වූ ජනතාව වෙනුවෙන් ස්වයං රැකියා සඳහා උපකරණ හා ද්‍රව්‍ය ලබාදීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාම සේවා වසම් 04 ක ප්‍රතිලාභීන්ට රු.845,250 ක් වැයකර සහල් නිෂ්පාදන යන්ත්‍ර 23 ක් 2016 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන බෙදා දී තිබුණි. 2017 ජුලි 11 දින සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 10 දෙනෙකු සඳහා ලබාදුන් යන්ත්‍ර අදාළ අරමුණ වෙනුවෙන් භාවිතා නොකර ප්‍රතිලාභීන්ගේ නිවෙස්වල නිෂ්කාර්යව පැවතුණි.

(ii) ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාම සේවා වසම් 04 ක ප්‍රතිලාභීන් 24 දෙනෙකු සඳහා වී මිලදී ගැනීම වෙනුවෙන් 2016 දෙසැම්බර් මාසයේදී රු.360,000 ක් වටිනා චෙක්පතක් වී අලෙවි මණ්ඩලය වෙත ලියා තිබුණත්, 2017 ජුලි 11 දින වන විටත් වී මිලදී ගෙන ප්‍රතිලාභීන්ට බෙදාදී නොතිබුණි.

(iii) ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ග්‍රාම සේවා වසම් 06 ක ප්‍රතිලාභීන් 46 දෙනෙකු සඳහා 2016 දෙසැම්බර් මාසයේදී රු.276,000 ක් ගෙවා පොහොර මිලදී ගෙන තිබුණත්, 2017 ජුලි 11 දින වන විටත් ප්‍රතිලාභීන් 36 දෙනෙකු සඳහා පමණක් පොහොර බෙදා දී තිබුණි.

**3.2.2 සමාජ සේවා අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරිම**

සමාජසේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද ආබාධිත පුද්ගලයින් සඳහා රු.3,000 ක දීමනාවක් ලබාදීමේ වැඩසටහන සඳහා 2016 ජනවාරි 06 දිනැති අංක NCPD 3/2015 දරන සමාජසේවා අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 9 ඡේදය ප්‍රකාරව තෝරාගන්නා ලද ප්‍රතිලාභීන්ට අදාළ දීමනාව බැංකු ගිණුම මගින් සිදුකළ යුතුව තිබුණි. ආලයඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 ජනවාරි මාසයේ සිට 2016 අගෝස්තු මාසය දක්වා එකතුව රු.4,740,000 ක දීමනාව මුදලින් ගෙවා තිබුණු බැවින් අදාළ මුදල් ප්‍රතිලාභියාට ලැබු බව තහවුරු කර ගැනීමට නොහැකි විය.

**3.2.3 ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරිම**

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද “ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන” යටතේ තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ජල සැපයුම් 04 ක් වෙනුවෙන් එකතුව රු.3,565,008 ක් 2016 දෙසැම්බර් මාසය වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ගෙවා තිබුණි. නමුත් 2017 ජුලි 10 දින වන විටත් අදාළ ජල සැපයුම් ලබාදී නොතිබුණි.

### 3.3 පොදු තැන්පත් ගිණුම

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු.5,202,535 ක් වූ තැන්පතු 83 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2013 හා 2014 වර්ෂවලදී කොවිල් පුනරුත්ථාපනය හා ශක්ති විද්‍යාලය සංවර්ධනය කිරිම වැනි සංවර්ධන ව්‍යාපෘති සඳහා තිරුන්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.මිලියන 1.06 ක් ලබා දී තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ අරමුණ වෙනුවෙන් එම මුදල උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

### 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---------------------------------------------------------------

විෂය අංක 27001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,714,336 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 03 ක සිට මාස 09 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, 2016 දෙසැම්බර් 31 දින වන විටත් එම ශේෂ අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත්වී තිබුණි.

(ආ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශයේ පෙන්වා තිබුණු මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු එකතුව රු.2,168,938 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

--------------------------

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිල නිවාස 12 ක්, වර්ෂ 01 ක සිට වර්ෂ 06 දක්වා කාලයක් භාවිතා කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවැතුණි.

(ආ) අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ ඉඩමේ (King Abdulla Model Town) ඉදිකිරීම් කටයුතු සඳහා සවි කිරීමට ලබාගෙන ඇති විදුලි උපකරණ හා නාන කාමර අයිතමයන් සවිනොකර වර්ෂ 06 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

## 3.6 අනුකූල නොවීම්

**(අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නිති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| මුදල් රෙගුලාසි 141 | චෙක්පතක් ලිවීමේදී පළමු අත්සන යොදා දෙවන අත්සන යෙදිය යුතු වුවත්, සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් දෙවන අත්සන පමණක් යොදා රු.53,922 ක වටිනාකමින් යුත් චෙක්පතක් බැංකුවට ඉදිරිපත් කර තිබුණි. |
| **(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| 5.4.11 මාර්ගෝපදේශය | කොන්ත්‍රාත් සඳහා ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර ආදායම් බදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමේදී එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, නියැදි පරීක්ෂාවේදී 2016 වර්ෂයේ ගෙවන ලද රු.33,236,926 ක එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් වූ තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නින්දවූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද නින්දවූර් බල ප්‍රදේශයේ පිහිටි "අල්මීනා විද්‍යාලයේ අභ්‍යන්තර බැඩ්මින්ටන් ක්‍රීඩා පිටිය ඉදිකිරීම" වෙනුවෙන් එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවෙකුට රු.495,724 ක මුදලක් එකතු කල අගය මත බදු ලෙස ගෙවා තිබුණි.

(ii) ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ, ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද පානම ආර් වන්දෙස්න හා ලාහුගල මහජන ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු එකතු කල අගය මත බදු මුදල වූ රු.527,281 ක් 2016 දෙසැම්බර් 29 වන දින සිට 2017 මාර්තු 23 දින දක්වා නොගෙවා පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

## 3.7 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවල දී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|---|
| | | රු. | | |
| (i) | උහන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකිරීම. | 2,725,017 | 2016.12.20 | නිවැරදි ලෙස ඇස්තමේන්තු සකස් නොකිරීම හා කොන්ත්‍රාත්කරුවෙකු ඉදිරිපත් නොවීම. |
| (ii) | දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම | 9,000,000 | 2016 | ඉඩම තෝරා ගැනීම සම්බන්ධයෙන් වූ ගැටළුවක් නිසා ක්‍රියාත්මක කර නොතිබුණි. |

### (ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අතහැර තිබුණි.

| ව්‍යාපෘතිය | | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2016 දෙසැම්බර් 31 දින වන විට වියදම | අත්හැර දැමීමට හේතු |
| --- | --- | --- | --- | --- | --- |
| ---------- | | ---------------- | ---------- | ------------------ | --------------------- |
| | | රු. | | රු. | |
| (i) | දමන පොසොන්පුර ක්‍රීඩා පිටිය හා වේදිකාව ඉදිකිරීම | 1,455,348 | 2014.10.27 | 217,087 | 2014 වර්ෂයේ සකස් කල මිල ගණන් මත ඉටු කළ නොහැකි බව කොන්ත්‍රාත්කරු ප්‍රකාශ කිරීම. |
| (ii) | අම්පාර නවගම්ගොඩ අමුණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය. | 2,524,654 | 2014.11.15 | 141,960 | ශක්‍යතා අධ්‍යයනයේදී තිබුණු තත්ත්වය සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු සකස් කර තිබුණත්, වර්තමානයේදී එම පිරිවැය වැඩිවීම නිසා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. |
| (iii) | කල්මුණ ප්‍රදේශයේ කල්මුණිකුඩි ග්‍රාමසේවා වසම් 04 හි මහජන ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම | 1,000,000 | 2014.08.13 | 320,877 | කොන්ත්‍රාත් සමාගමේ දුර්වලතාවය හා කාලගුණික තත්ත්වයන්හි බලපෑම්. |
| (iv) | නින්දවූර් පල්ලවේලි මාර්ගය ඉදි කිරීම. | 2,000,000 | 2014.11.30 | 219,846 | මෙම ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ ද අදාළ කුඹුරු හිමියන් අතර, ඇතිව තිබූ ගැටුම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම. |
| (v) | සායින්දමරුදු සහිරා විද්‍යාලයේ පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම. | 5,000,000 | 2014.12.30 | 1,252,979 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම හා පාසල් විභාග හා අධික වර්ෂාව නිසා නිම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | කිරීමට නොහැකි වී තිබුණි. |
| (vi) | සායින්දමරුදු සහිරා විද්‍යාලයේ ක්‍රීඩාංගණය ඉදිකිරීම. | 3,324,020 | 2016.09.15 | නැත | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබීම, බව, පාසල් විභාග හා අධික වර්ෂාව නිසා නිම කිරීමට නොහැකි වී තිබුණි. |

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

---------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | නිම කළ දිනය | 2016 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | - රු. | | | | රු. | |
| (i) | අම්පාර නවගම්පුර සද්ධාතිස්සපුර ප්‍රාථමික විද්‍යාලයේ නව දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම. | 4,916,439 | 2014.11.21 | 2015.01.04 | 2016.12.23 | 4,380,000 | කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය හා ප්‍රමාදවී අරමුදල් ලැබීම |
| (ii) | අම්පාර ඩී.එස්. සේනානායක විදුහලේ ක්‍රීඩාංගණය හා ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීම. | 2,468,744 | 2014.12.31 | 2015.02.15 | 2015.12.19 | 2,058,107 | භූමිය සම්බන්ධයෙන් ඇතිව තිබූ නීතිමය ගැටළු හා අධීක්ෂණ කටයුතු දුර්වලවීම. |
| (iii) | උදයපුර ක්‍රීඩාංගණය හා ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීම. | 2,615,097 | 2014.10.20 | 2014.12.05 | 2015.12.20 | 2,443,661 | කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය හා ප්‍රමාද වීඅරමුදල් ලැබීම. |
| (iv) | අම්පාර රජවැව ක්‍රීඩාංගණය ඉදිකිරීම. | 954,231 | 2014.11.24 | 2015.01. 08 | 2015.12.19 | 945,676 | ප්‍රමාද වී අරමුදල් ලැබීම. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| (v) | බොල්වේරියන් මාර්ගය සංවර්ධනය | 01 | 1,179,375 | 2013.12.31 | 2014.03. 31 | 2016.12.31 | 1,179,234 | ප්‍රමාද වී අරමුදල් ලැබීම |

## 3.8 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) අරමුණින් බැහැරව ව්‍යාපෘති ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 වර්ෂයේදී ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මඟින් දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 9.00 ක ප්‍රතිපාදන අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදී තිබුණි. නමුත් එම ප්‍රතිපාදන වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන කටයුතු වෙනුවෙන් උපයෝජනය කර තිබුණි.

(ii) ක්‍රීඩා අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද "ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේ වැඩසටහන" යටතේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටි පානම ආර් වන්දෙසන හා ලාහුගල මහජන ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම සඳහා රු.3,990,000 ක් වැයකර තිබුණි. ක්‍රීඩාපිටි දෙක වටා එකක් රු.6,800 බැගින් ආධාරකයක් සහිත කුඩා ප්‍රමාණයේ CFL බල්බ් 185 ක් යොදා ඒ සඳහා රු.1,258,000 ක් වැය කර ආලෝක කණු ඉදිකර තිබුණි. නමුත් එම ක්‍රීඩා පිටි රාත්‍රී කාලයේදී භාවිතා නොකරන බැවින් හා ඉහත සඳහන් කුඩා බල්බ් යෙදීමේ අවශ්‍යතාවයක් ද නොතිබූ බැවින්, මෙම මුදල ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීමේ අරමුණු සඳහා ඵලදායී ලෙස භාවිතා කර නොතිබුණි.

### (ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 වර්ෂය සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ "පෙර පාසල් දරුවන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන" අම්පාර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර තිබුණි. සුදුසුකම් ලැබූ පෙර පාසල් 739 ක ළමුන් 21,005 ක් සිටි අතර, ඒ සඳහා දෛනික කිරි අවශ්‍යතාවය ලීටර 3,151 ක් ව පැවතුණි. නමුත් ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය සැලකූ විට ඉහළ කිරි නිෂ්පාදනයක් සහිත අම්පාර දිස්ත්‍රික්කයේ 2016 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක පිහිටි පෙර පාසල් 92 ක ළමුන් 3,722 ක් සඳහා පමණක් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. මේ නිසා ව්‍යාපෘතිය මඟින් පෙර පාසල් ළමුන්ගේ වර්ධනය සඳහා ඉවහල් වන විටමින් ප්‍රමාණය ලබාගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(ii) 2014 දෙසැම්බර් මාසයේ ලාහුගල හා දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයට බලපෑ ගංවතුර තත්ත්වයෙන් හානියට පත් නිවාස ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රතිලාභීන්ගේ ලේඛනය නිවැරදිව සකස් කර නොතිබුණි. එමෙන්ම එම තොරතුරු අමාත්‍යාංශයට නිවැරදිව ඉදිරිපත් කර නොතිබුණු නිසා 2016 වර්ෂයේදී ප්‍රතිලාභීන් සඳහා ලද රු.මිලියන 23.69 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 13.67 ක ප්‍රමාණයක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. මේ නිසා එම ප්‍රතිපාදන අමාත්‍යාංශයේ වෙනත් ව්‍යාපෘතියක ප්‍රතිලාභීන් සඳහා යොදා ගැනීමට තිබූ අවස්ථාව අහිමිවී තිබුණි.

## 3.9 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ පළාත් නැඟුම වැඩසටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ දමන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පොසොන්පුර ක්‍රීඩාංගණය හා වේදිකාව ඉදිකිරීමට රු.1,500,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට රු.217,087 ක කාර්යයන් පමණක් සම්පූර්ණ කර තිබුණි. ඒ අනුව ජනතාවට ලබාගත හැකිව තිබූ ප්‍රතිලාභ අහිමි වී තිබුණු අතර, කොන්ත්‍රාත්තුව නිම නොකිරීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට එරෙහිව ක්‍රියාමාර්ගයක් ද ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ නින්දවූර් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් පල්ලවෙලි මාර්ගය ඉදිකිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව රු.2,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු නමුත් 2016 දෙසැම්බර් 31 වනවිට රු.219,846 ක මුදලක් පමණක් වියදම් කර පසුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අත්හැර දමා තිබුණි. එම නිසා මෙම වියදම ඵලදායී නොවන වියදමක් බව දක්නට ලැබුණි.

(ඇ) 2014 වර්ෂයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගමනැඟුම සංවර්ධන වැඩසටහන යටතේ සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් සහිරා විද්‍යාලයේ පන්ති කාමර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු.5,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 වර්ෂයේ අදාල සියළු මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණත්, 2016 දෙසැම්බර් 31 දින වන විට අදාළ ව්‍යාපෘතිය නිම කර නොතිබුණු අතර එ සඳහා රු.1,252,979 ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව අදාළ ව්‍යාපෘතිය මඟින් පාසල් දරුවන්ට ලබාගත හැකිව තිබූ ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි. මේ නිසා කොන්ත්‍රාත්තුව නිම නොකිරීම සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද 2016 වර්ෂය සඳහා ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම් ව්‍යාපෘතිය යටතේ සායින්දමරුදු ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් සහිරා විද්‍යාලයේ ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීම සඳහා රු.4,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. ගිවිසුම අනුව ව්‍යාපෘතිය 2016 ඔක්තෝබර් 31 දින නිමකළ යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. මේ නිසා ව්‍යාපෘතිය මඟින් පාසල් දරුවන්ට ලබා ගැනිමට හැකියාව තිබුණත් ප්‍රතිලාභ අහිමි වී තිබුණි. එමෙන්ම කොන්ත්‍රාත්තුව නිම නොකිරීම සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගයක් ද ගෙන නොතිබුණි.

(ඉ) 2014 වර්ෂය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ නින්දවූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අල්මීනා විද්‍යාලයේ අභ්‍යන්තර බැඩ්මින්ටන් ක්‍රීඩා පිටිය ඉදිකර තිබුණි. ඒ සඳහා සකස් කරන ලද මූලික ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රමාණයන් ඉක්මවා ගෙවීම් කිරීම නිසා රු.1,013,169 ක් වැඩිපුර ගෙවා තිබුණි. එම නිසා මූලික ඇස්තමේන්තුවේ ඇතුළත් වූ රු.929,010 ක වටිනාකමින් යුත් විදුලි සැපයුම් ලබාදීම, ඇළුමිණියම් දොරවල් හා ජනෙල් සවිකිරීම ඇතුළු කාර්යයන් 20 ක ඉදිකිරීම් කටයුතු සිදුකිරීමට නොහැකි වී තිබුණි.

## 3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කළයුතු ශේෂ

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| | ගැලැපුම් පිළිබඳ විස්තරය | කාල විශ්ලේෂණය | | එකතුව |
|---|---|---|---|---|
| | | මාස 6 කට වැඩි වර්ෂ 1 කට අඩු | වර්ෂ 1 කට වැඩි වර්ෂ 3 කට අඩු | |
| | | රු. | රු. | රු. |
| (i) | උපලබ්ධි නොවූ තැන්පතු | - | 10,000 | 10,000 |
| (ii) | නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 152,539 | - | 152,539 |
| (iii) | හඳුනා නොගත් හර | 86,048 | - | 86,048 |
| (iv) | හඳුනා නොගත් බැර | 800 | - | 800 |
| | **එකතුව** | **239,387** | **10,000** | **249,387** |

## 3.11 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එකතුව රු.6,112,961 ක්වූ පානීය ජල ළිං 30 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ලංසු විවෘත කිරීමේ රැස්වීමට කොන්ත්‍රාත්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයෙක්ද කමිටුවේ සභාපතිවරයාගේද සහභාගිත්වයෙන් තොරව කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(ii) 2016 දෙසැම්බර් මාසයේදී පදියතලාව හා ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රු.4,694,074 ක ලී බඩු හා කාර්යාල උපකරණ ලබා ගැනිමට ලංසු කැඳවීමකින් තොරව මිලදී ගෙන තිබුණි.

(iii) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන "ගර්භනි මව්වරුන් සඳහා පෝෂ්‍යදායි ආහාර වේලක් ලබාදීමේ වැඩසටහන" යටතේ, 2016 අප්‍රේල් 11 දිනැති අංක 06/2016 දරන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව ප්‍රසම්පාදන තීරණය අනුව මිලදී ගැනීම සැපයුම්කරුවන් කිහිපදෙනෙකු මගින් සිදුකළ යුතු වුවත්, එයට පටහැනිව සම්මන්තුරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක් මාසයක් තුලදී සියළු මිළදී ගැනීම් එක් සැපයුම්කරුවෙකුගෙන් පමණක් සිදුකර තිබුණි.

(iv) 2016 වර්ෂය සඳහා ජාතික සමගිය හා සංහිදියා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කරන ලද "ආර්ථික සහයෝගිතා වැඩසටහන" ව්‍යාපෘතිය යටතේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගන්නා ලද රු.1,391,500 ක් වටිනාකමින් යුත් වතුර පොම්ප 46 ක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව තනි සැපයුම්කරුවෙක්ගෙන් පමණක් මිලදී ගෙන තිබුණි.

**(ආ) අධිකාරි බලය නොමැති වූ ගනුදෙනු**

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් විසින් කොන්ත්‍රාත් කටයුතු වෙනුවෙන් ගෙවීම් කරන ලද එකතුව රු.3,518,152 ක ගෙවීම් වවුචර 06 ක් අධිකාරි බලය නොමැතිව අනුමත කර තිබුණි.

(ii) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද "අවතැන් වූ පවුල් සඳහා පානීය ජල ළිං ඉදි කිරීමේ ව්‍යාපෘතිය" යටතේ, අදාළ ජල ළිං ඉදි කිරීම 2016 මැයි 02 දැනැති අංක එම්ආර්/04/40 දරන බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ උපදෙස් පරිදි ප්‍රතිලාභියා විසින්ම සිදුකළ යුතු වුවත්, මහඔය හා තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකතුව රු.10,272,961 ක ජල ළිං 50 ක් ඉදිකිරීම අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්කරුවන් මගින් සිදුකර තිබුණි.

**3.12 පාඩු හා හානි**

--------------

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් බිඳ දැමීමෙන් සිදුවූ අලාභය රු.850,738 ක් ලෙස තක්සේරු කර අදාල අමාත්‍යාංශ වෙත තොරතුරු ඉදිරිපත් කර තිබූ නමුත්, 2016 දෙසැම්බර් 31 වනවිටත් අවසන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.13 අනාර්ජික ගනුදෙනු

2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද එක ගමකට එක වැඩක් වැඩසටහන යටතේ කල්මුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද කල්මුණිකුඩි 04 ග්‍රාමසේවා වසමේ මහජන ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේදී ඇස්තමේන්තුව අනුව ඉටු නොකරන ලද කාර්යයන් වෙනුවෙන් රු.120,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3.14 විසඳා නොතිබුණු විගණන ඡේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2014 | 3.1 | ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා නොතිබීම. |
| 2014 | 3.9 | කැබ් රථයක් අළුත්වැඩියා නොකර වසර ගණනාවක් ගාල්කර තිබීම. |
| 2015 | 3.6 (ආ) (i) | මහඔය බල ප්‍රදේශයේ පිහිටි කළුපැණිබැද්ද පෙරපාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම් නිම නොකිරීම. |
| 2015 | 3.6 (ආ) (ii) | මහඔය බල ප්‍රදේශයේ පිහිටි ටැම්පිටිය විද්‍යාලයේ ගුරු නේවාසිකාරගාරයේ ඉදිකිරීම් කටයුතු නිම නොකිරීම. |
| 2015 | 3.6 (ආ) (iii) | මහඔය බල ප්‍රදේශයේ පිහිටි වරාපිටිය විද්‍යාලයේ ක්‍රීඩාංගණය සංවර්ධනය කිරීමේ කටයුතු නිම නොකිරීම |
| 2015 | 3.6 (ආ) (iv) | පදියතලාව බල ප්‍රදේශයේ පිහිටි මරංගල ප්‍රජාශාලාව ඉදිකිරීමේ ඉතිරි කටයුතු නිම නොකිරීම. |
| 2015 | 3.11 | සද්ධාතිස්සපුර ගබඩාව බිඳ දැමීමෙන් සිදුවූ අලාභය අයකර නොගැනීම |

## 3.15 මතභේදයට තුඩුදුන් කරුණු

ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ 1.2 වගන්තිය ප්‍රකාරව පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන නිලධාරියෙකු හා ඔහුගේ කාලත්‍රයා විසින් වෙළෙඳ ආයතනයක් පවත්වා තිබුණි. පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම වෙළෙඳ ආයතනයෙන් ගර්භනී මව්වරුන්ගේ පෝෂණ මළු වැඩසටහන සඳහා අදාළ එකතුව රු.8,146,000 ක වටිනාකමින් යුත් ආහාර ද්‍රව්‍ය 2016 මැයි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ මිලදී ගෙන තිබුණි.

## 3.16 කළමනාකරණ දූර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද "පෙර පාසල් ළමුන්ට කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන" යටතේ,2015 පෙබරවාරි 10 දිනැති අංක 2015/01 දරන කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 4.4 ඡේදය ප්‍රකාරව ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් නිරන්තරයෙන් කිරිවල සෞඛ්‍යාරක්ෂිත තත්ත්වය හා පශු වෛද්‍ය නිලධාරින් විසින් කිරිවල ගුණත්වය පරීක්ෂා කළ යුතුව තිබුණි. 2016 වර්ෂය සඳහා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබාදුන් කිරි සඳහා චක්‍ර ලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ විදාතා සම්පත් මධ්‍යස්ථානය වර්ෂ 08 ක පමණ කාලයක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, මධ්‍යස්ථානය සතුව පවතින රු.ලක්ෂ 15 ක් පමණ වටිනා පරිගණක උපාංග, යෝගට් නිෂ්පාදන යන්ත්‍ර හා, ආහාර විජලන යන්ත්‍රය භාවිතා කිරීමකින් තොරව ගබඩා කර තිබුණි. මේනිසා මධ්‍යස්ථානය මඟින් ජනතාවට ලබාදීමට තිබූ ප්‍රතිලාභ ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඇ) කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ගැබිණි මව්වරුන් සඳහා මාසිකව රු.2,000 ක පෝෂ්‍යදායී ආහාර මල්ලක් ලබාදීමේ වැඩසටහනට අදාළව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 අප්‍රේල් මාසය වෙනුවෙන් රු.92,000 ක් වටිනා පෝෂණ මළු 46 ක් බෙදාහැරීමෙන් තොරව, ඉතිරි වී තිබුණි. එම මළු 2016 අගොස්තු 31 දින සිට 2016 නොවැම්බර් 23 දින වනතුරු අවිධිමත්ව ගබඩා කර තිබූ අතර, ආහාර ද්‍රව්‍ය පරිභෝජනයට ද නුසුදුසු තත්ත්වයේ පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 මැයි මාසයේ අරණායක ප්‍රදේශයේ නායයෑමෙන් අවතැන් වූ පවුල්වල පාසල් දරුවන් සඳහා බෙදාහැරීමට දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ ජනතාව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පරිත්‍යාග කරන ලද රු.62,395 ක වටිනාකමක් සහිත පාසල් උපකරණ තොගයක් බෙදාහැරීමෙන් තොරව 2016 නොවැම්බර් 23 දින වන විටත් අවිධිමත් ලෙස ගබඩා කර තිබුණි.

(ඉ) දෙහිඅත්තකණ්ඩිය, ආලයඩිවෙම්බු, දමන හා සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ක්‍රියාත්මක වූ වේලා සටහන් යන්ත්‍ර අක්‍රීය වී තිබුණත් ඒවා නැවත අළුත්වැඩියා කර ක්‍රියාත්මක කිරීමට 2016 දෙසැම්බර් 31 දින වන විටත් කළමණාකරණය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 ජූනි මාසයේ වැටුප් බැංකුගත කිරීමේ දී සිදුවූ වරදක් හේතුවෙන් රු.34,430 ක ශේෂයක් හඳුනා නොගත් ශේෂයක් ලෙස, 2016 ජූනි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වාම පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශවල පැවතුණි. එය නිවැරදි කිරීමට 2016 නොවැම්බර් 22 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(උ) උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ විදාතා සම්පත් මධ්‍යස්ථානය හා එහි පැවැති යන්ත්‍ර හා උපකරණ 2013 පෙබරවාරි 13 දින සිට භාවිතයෙන් තොරව 2016 නොවැම්බර් 10 දින දක්වා වර්ෂ 04 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව පැවැතුණි.

(ඍ) පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2015 වර්ෂයේ සිට පැවත එන රු.86,047 ක් වටිනා හඳුනා නොගත් ගෙවීම් බැංකු සැසඳුම් ප්‍රකාශයේ පෙන්නුම් කරන නමුත්, ඒවා හඳුනාගෙන නිවැරදි කිරීමට 2016 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(එ) සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් 31 වන දින පුද්ගලික ආයතනයකින් නිකුත් කරන ලද රු.100,000 ක් වටිනා චෙක්පතක් 2016 ජූනි 30 දින වන විටත් මුදල් කර ගැනීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොතිබුණි.

**3.17 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 84 | 77 | 7 | - |
| (ii) | තෘතියික මට්ටම | 83 | 16 | 67 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,874 | 1,676 | 198 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 214 | 233 | - | 19 |
| | **එකතුව** | **2,255** | **2,002** | **272** | **19** |